# ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය

இலங்கை அரசாங்க சேவை விளையாட்டுச் சங்கம்

# Sri Lanka Government Service Sports Society

No. 2/12, 2/16, Polhengoda Road, Narahenpita, Colombo 05.

Tel & Fax : 011-2513012 Email : srilankagsss.2024@gmail.com


මගේ අංක :- රාසේක්‍රීස / ක්‍රීඩා තරග / 2026 2026.09.30 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, රාජ්‍ය ආයතන හා පළාත් සභා ලේකම්වරුන්.

මහත්මයාණෙනි / මහත්මියෙණි,

**ශ්‍රී ලංකා රාජ්‍ය සේවා එල්ලේ තරගාවලිය - 2026**

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය සංවිධානය කරනු ලබන උක්ත තරගාවලිය 2026 **නොවැම්බර් මස 25, 26 සහ 27 යන දිනයන්හි දී, කැළණිය - සිවලී කැළණිතිස්ස ක්‍රීඩාංගණයේ දී** පැවැත්වීමට කටයුතු යොදා ඇත. මේ සඳහා ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල නිළධාරීන් දැණුවත් කර, ඔවුනට තරග සඳහා සහභාගීවීමට කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**තරග කොන්දේසි**

ශ්‍රී ලංකාවේ සියලුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු / ආයතන හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු සහ රාජ්‍ය සේවයේ ස්ථිර හෝ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත නිළධාරීන් / නිළධාරිනියන් හට මෙම ක්‍රීඩා තරගාවලියට සහභාගීවිය හැකි අතර, ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ඇති ආයතනයන් හි ස්ථිර නිළධාරීන්/ නිළධාරිනියන් ට ද මෙම තරගාවලියට ඉල්ලුම්කිරීමට හා සහභාගීවීමට හැකිය.

මෙම තරග....**විවෘත පිරිමි**, **ආධුනික පිරිමි** සහ **කාන්තා** වශයෙන්, කාණ්ඩ තුනක් (03) යටතේ පැවැත්වීමට, තරගාවලියේ එක් කණ්ඩායමක් අතිරේක ක්‍රීඩකයින් / ක්‍රීඩිකාවන් සමග 20 දෙනෙකු ගෙන් සමන්විත විය යුතුය. එක් **කණ්ඩායමකට පන්දු වාර 30ක්** යොමු කෙරේ.

එක් තරග කාණ්ඩයක් සඳහා එක් ආයතනයකින් ඉදිරිපත් කල හැක්කේ තරග කණ්ඩායම් එකක් (01)පමණි**තරග සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය 2026නොවැම්බර් 14 දින වේ**. දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව, තරග අයදුම්පත් අදාල ආකෘති පත්‍රයට අනුකූලව සකස්කර, තරග ගාස්තු සමඟ අදාල අයදුම්පත් ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගම් මූලස්ථානයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

සියලුම තරග අදාල ක්‍රීඩා සම්මේලනයේ නීති - රීතිවලට අනුකූලව, ප්‍රථිමලුන් පිටුදැකීමේ (Knock out) ක්‍රමයට පැවැත්වේ. තරග සඳහා පැමිණෙන සියලුම තරගකරුවන් / තරගකාරියන් තරගයට උචිත ඇඳුමකින් සහ පාවහන්වලින් සැරසී, තරගයට අවශ්‍ය නීත්‍යානුකූල පෞද්ගලික උපකරණ රැගෙන ආයුතු අතර, තරගයට අවශ්‍ය පන්දු සංවිධායකයින් විසින් ලබා දෙනු ඇත.


**President**
**G.L. Sajith Jayalal**
Director,
National Institute of Sports Science,
#100/7, Independence Avenue,
Colombo - 07.
Mobile : 071 420 7008

**General Secretary**
**M. Judith Priyani Perera**
Library Information Officer,
National Institute of Sports Science,
#100/7, Independence Avenue,
Colombo - 07.
Mobile : 070 307 9421

**Treasurer**
**M.K.W.S. De Silva**
MSA Samsudeen Dev. (Pvt) Ltd.
#163, Union Place,
Colombo - 02.
Mobile : 071 22 33 888

තරග විනිසුරුවන්ගේ කීරණ අවසන් කීරණ වන අතර, යම් විරෝධතාවයක් වේ නම් අදාළ තරගය නිමවී පැයකි විස්ස (20) ක් ගතවීමට පෙර, එම විරෝධතාව පැහැදිලිව, ලිඛිතව තරග ලේකම්වෙත ඉදිරිපත් කළ යුතුවේ. විරෝධතා ගාස්තුව රුපියල් එක් දහස (1000.00) ක් වේ. මෙහිදී තරගාවලියේ අවසන් කීරණය සංවිධායක කමිටුව සතුවේ.

**පොදු කොන්දේසි**

# සියලුම තරගකරුවන් / තරගකාරියන් අයදුම්පතේ තම අත්සන යොදා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තම ආයතන ප්‍රධානී ගේ අත්සනින් එය ඉදිරිපත් කළ යුතු අතර, තරගයට සහභාගිවීමේ දී තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සේවා හැඳුණුම්පත ඉදිරිපත් කළ යුතුවේ. සේවා හැඳුණුම්පතක් නිකුත්කර නොමැති අයට ජාතික හැඳුණුම්පත සමග ආයතන ප්‍රධානී විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුවේ.

# මෙම තරගාවලියේ එක් කාණ්ඩයක තරග සඳහා ඉල්ලුම්පත් ගාස්තුව රුපියල් පන්දහස (5,000.00) ක් වන අතර, අනෙක් කාණ්ඩ සඳහා තරග කරන්නේ නම්ඉහත සඳහන් පරිදි ඉල්ලුම්පත් ගාස්තු ගෙවිය යුතු වේ. තරග සඳහා අදාළ ආයතනය ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 500.00 ක් වේ.

# තරගාවලිය සඳහා සහභාගිවන සියලුම තරග කණ්ඩායම් ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව, නිසි ලෙස සකස් කරන ලද ඉල්ලුම් පත්‍ර සහ ඊට අදාළ මුදල් සමග අයදුම්පත් භාරගන්නා **අවසන් දිනය වන 2026 නොවැම්බර් 14 දින** හෝ ඊට පෙර, නාරාහේන්පිට, පොල්හේන්ගොඩ පාරේ , අංක 2/16 දරණ ස්ථානයේ ඇති ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයේ මූලස්ථානයට ගෙනැවිත් භාරදී, අදාල මුදල් ගෙවා රිසිට් පතක් ලබාගැනීම හෝ "ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය" නමින් නාරාහේන්පිට, නවලෝක් නැෂනල් බැංකු ගිණුමේ ගිණුම් අංක - 1040 1000 2466 ට මුදල් බැරකොට, එම රිසිට්පතෙහි මුල් පිටපත අයදුම්පත්‍ර සමඟ අමුණා, අයදුම්පත් භාරගන්නා දිනට පෙර ලැබෙන සේ හෝ ඊට පෙර " එල්ලේ තරග අයදුම්පත් " යනුවෙන් ලිපිකවරයේ වම්පස ඉහලින් සඳහන් කර, ඉහතින් දක්වා ඇති අප සංගමයේ ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

# අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැණුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

# මෙම තරගාවලිය සඳහා සහභාගිවන සියලුම තරග කණ්ඩායම් තම තමන් ගේ සියලු බඩු බාහිරාදිය ප්‍රවේශම් කරගැනීමට වගබලාගත යුතු අතර, යම් අස්ථාන ගතවීමක් හෝ අප සංගමය වගකියනු නොලැබේ.

# සියලුම කණ්ඩායම් තරග කණ්ඩායම් ආරම්භක දින පෙ.ව. 8.30 ට පැවැත්වෙන සම්මාරම්භක උත්සවයට සහභාගිවන ලෙසට ආරාධනා කරන අතර, තරග සම්බන්ධව යම් විමසිමක් ඇත්නම් තරග සංවිධායක ලේකම් - පී.කී.නිමල් චන්ද්‍රසිරි මහතාගෙන් - 071 8068 006 හෝ පෙව 9 සිට ප.ව 3 දක්වා පරිපාලන ලේකම් ( 0112 513 012) අමතන්න.

එම්.සුදිත් ප්‍රියාණි පෙරේරා,
ප්‍රධාන ලේකම්.

පී.කී.නිමල් චන්ද්‍රසිරි.
තරග ලේකම් - එල්ලේ

# රාජ්‍ය සේවා එල්ලේ තරඟාවලිය - 2026

විවෘත පිරිමි /ආධුනික පිරිමි /කාන්තා

| අංකය | නම | ජා. හැ. අංකය | අත්සන |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |
| 07. | | | |
| 08. | | | |
| 09. | | | |
| 10. | | | |
| 11 | | | |
| 12. | | | |
| 13. | | | |
| 14. | | | |
| 15. | | | |
| 16. | | | |
| අතිරේක | | | |
| 17. | | | |
| 18. | | | |
| 19. | | | |
| 20. | | | |

01. දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ නම :- .....

02. ලිපිනය :- .....

03. ක්‍රීඩා ලේකම්ගේ නම :- ..... අත්සන :- .....

ලිපිනය :- .....

දුරකතන අංකය :- .....

ඉහත නම් සඳහන් කර ඇති කණ්ඩායම මෙම දෙපාර්තමේන්තුවේ /අමාත්‍යාංශයේ නිලධාරීන් බව සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :- .....

අත්සන :- ..... නිලමුද්‍රව :- .....

තනතුර :- ..... දිනය :- .....